**නිකවැරටිය ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි විෂයයන් 611 කට අදාළ වටිනාකම් තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සභාව සතු ලීබඩු හා කාර්යාල උපකරණ විෂයයන් 41 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**
**---------------------**

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල පැවති ශේෂයන් අතර රු.59,427,233 ක වෙනසක් විය.

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**
**------------------------------------**

(අ) ලැබියයුතු ගිණුම්
--------------------

2017 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.59,519,595 ක් වූ අතර, 2018 ජූලි 11 දින වන විට තවදුරටත් අයවිය යුතු ශේෂය රු.33,546,357 ක් විය.

(ආ) ගෙවියයුතු ගිණුම්
---------------------

2017 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.63,396,705 ක් වූ අතර, 2018 ජූලි 11 දින වන විට තවදුරටත් නිරවුල් කර නොමැති ශේෂය රු.39,670,593 ක් විය.

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.75,537,071 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

### 1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) 193 රීතිය | එක් එක් ආදායම් හා වියදම් විෂයය යටතේ වන අතිරික්තයන් හා ඉතිරිවීම් පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 218 රීතිය | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වාර්ෂිකව සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 571 (2) | වර්ෂ 02 ක කාලයක් ඉක්මවූ රු.1,554,064 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,653,263 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,571,888ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තු ගතආදායම් | 2017 බිල්කළ ආදායම් | 2017 රැස්කළ ආදායම් | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තු ගතආදායම් | 2016 බිල්කළ ආදායම් | 2016 රැස්කළ ආදායම් | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (I) වරිපනම් හා බදු | 3,483 | 3,778 | 3,612 | 2,184 | 3,373 | 3,503 | 3,228 | 2,018 |
| (II)බදු කුලී | 25,401 | 21,579 | 21,010 | 7,083 | 9,701 | 12,335 | 18,029 | 6,514 |
| (III)බලපත්‍ර ගාස්තු | 1,200 | 1,327 | 1,247 | 80 | 1,252 | 1,319 | 1,319 | - |
| (IV)වෙනත් ආදායම් | 76,361 | 64,052 | 58,615 | 28,628 | 78,505 | 63,385 | 61,661 | 23,191 |
| එකතුව | 106,445 | 90,736 | 84,484 | 37,975 | 92,831 | 80,542 | 84,237 | 31,723 |

සටහන

සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම් තුළ ඉකුත් වර්ෂයන්ට අදාළව රැස්කළ රු.17,171,135 ක් විය.

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

--------------------------------------

සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායම රුපියල් මිලියන 90 ක් වූ අතර, රුපියල් මිලියන 84 ක් සමාලෝචිත වර්ෂයේදී රැස්කර තිබුණි. එයින් රුපියල් මිලියන 17 ක් ඉකුත් වර්ෂයන්ට අදාළ ලැබීම් විය. රුපියල් මිලියන 84 ක් වූ රැස්කළ ආදායමෙන් සියයට 69 ක් හෙවත් රුපියල් මිලියන 58.6 ක් වෙනත් ආදායම් යටතේ රැස්කරගෙන තිබුණි.ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 31.7 ක් වූ මුළු හිඟය සමාලෝචිත වර්ෂය අවසානයට රුපියල් මිලියන 37.9 ක් ලෙස සියයට 20 කින් වර්ධනය වී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,142,335 ක් වූ වරිපනම් බදු හිඟයෙන් වර්ෂ 01 ත් 03 ත් අතර කාලයක සිට අයනොවී පවතින රු.393,768 ක් හා වර්ෂ 03 ක් ඉක්මවූ රු.1,043,693 ක් පැවතුණි. 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 32-42 ප්‍රකාරව කාර්තු පදනම් කරගෙන හිඟ ලැයිස්තු සකස් කර අදාළ නිවේදන නිකුත් කිරීමෙන් පසු දේපළ තහනමට ගෙන හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවියයුතු අක්කර බදු හා විනෝද බදු ශේෂය පිළිවෙලින් රු.20,731 ක් හා රු.20,577 ක් විය.

**2.2.4 කුලී**

------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.7,083,169 ක් වූ හිඟ කුලී ආදායමින් රු.5,688,300 ක් සෞඛ්‍ය මධ්‍යස්ථානය හා බස් නැවතුම්පල කඩකාමර වලට අදාල කීමනී විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ සභාව සතු කඩ කාමර 08 ක් කුලියට දීමට අදාළව අයවියයුතු හිඟ කුලිය රු.458,886 ක් විය.

(ඇ) සභාවට අයත් පළතුරු කුටි 11 කින් රු.45,200 ක්, එළවලු කුටියකින් අයවියයුතු රු.2,640 ක් හා පොදු වෙළඳපොල කඩ කාමර 18 කින් ලැබියයුතු රු.55,737 ක්ද වර්ෂ ගණනාවක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නිකවැරටිය බස් නැවතුම්පලෙහි බදු දී තිබෙන කඩ කාමර 05 කින් අයවිය යුතු එකතුව රු.60,431 ක් 2018 වර්ෂයේ ජූලි වන විටත් අයකරගෙන නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

--------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබියයුතුව තිබූ උසාවි දඩ රු.4,150,550 ක් හා මුද්දර ගාස්තු රු.18,162,671 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කාර්ය සාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව පළාත් පාලන ආයතනය විසින් මහජනයා වෙනුවෙන් කළ යුතු සේවාවන් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගතයුතු ක්ෂේත්‍රයන් 55 ක් සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇති අතුරු ව්‍යවස්ථා වැළඳගෙන ඒ අනුව කටයුතු කර තිබුණි. කුලී ත්‍රීරෝද රථ ගාල් කිරීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවක් සභාව විසින් සකස් කර පළාත් පාලන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර වර්ෂ දෙකක් ගතවී තිබුණද, ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි.

(ආ) ප්‍රතිපාදන නොසැලසීම

-------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත නොකළ ව්‍යාපෘති 03 ක් සඳහා රු.1,937,259 ක් වැයකර තිබුණි.

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය 2016 අප්‍රේල් 28 දින සිට ක්‍රියාත්මක කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී මධ්‍යස්ථානයේ සංවර්ධනයට රු.2,018,299 ක් වැයකර තිබුණි. දිරන කසළ ටොන් 704 කින් කොම්පෝස්ට් ටොන් 39 ක් නිෂ්පාදනය කර අලෙවි කිරීමෙන් සමාලෝචිත වර්ෂයේදී රු.397,470 ක ආදායම් උපයාගෙන තිබුණි. තවද කසළ කළමනාකරණ මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන භූමිය සභාවට පවරාගෙන නොතිබුණි.

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ''තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030'' පිළිබඳව අන්තර්ජාලය ඔස්සේ සභාව දැනුවත් වී තිබුණි. සභාව විසින් හඳුනාගත් අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමේ සූදානමක් ලෙස දුගී බව තුරන් කිරීම අරමුණු කරගෙන ගෙවතු වගා තරඟ පැවැත්වීම, ස්වයං රැකියා පුහුණු වැඩසටහන් හා ආධාර ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

විදුලි පහන් අළුත්වැඩියාව සඳහා වූ ඉල්ලීම් අංකය, ඒ සඳහා අවශ්‍ය/භාවිතා කරන ලද උපාංග, විදුලි උපාංගවල වගකීමේ කාලය, වර්ෂය තුළ එක් එක් වීථි පහන් අළුත්වැඩියාවන් පිළිබඳ විස්තර නිවැරදිව හඳුනාගත හැකි විධිමත් ලේඛනයක් සභාව විසින් පවත්වාගෙන නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 91 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට තථ්‍ය කාර්ය මණ්ඩලය 83 ක් විය. තෘතීයික මට්ටමේ එක් තනතුරක්, ප්‍රාථමික මට්ටමේ තනතුරු 07 ක් පුරප්පාඩුව පැවති අතර අනියම්/කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 24 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ආ) මාර්ග කම්කරු සහ සෞඛ්‍ය කම්කරු වශයෙන් පත්වීම් ලද සේවකයින් 03 ක් සහා කාර්යාලයේ කටයුතු සඳහා යොදවාගෙන තිබුණි.

(ඇ) විශ්‍රාම යාම, ස්ථාන මාරු හා සේවය අතහැර යාම මත 2018 ජූලි 11 දින වන විට රු.158,786 ක සේවක ණය අයවීමට තිබුණි.

## 3.4 හඳුනාගත් පාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අංක කේ-120 මෝටර් ග්‍රේඩරයේ ඉදිරිපස වාමුවාව සවිකිරීම සඳහා සභා අරමුදලින් රු.56,385 ක් වැයකර තිබුණු අතර, රු.24,817 ක් පමණක් රක්ෂණ ආයතනයෙන් ප්‍රතිපූර්ණය කර තිබීම හේතුවෙන් රු.31,563 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ආ) 2017 ඔක්තෝබර් 17 දින විදුලි භාණ්ඩ ගබඩාව භෞතික පරීක්ෂාවේදී රු.30,375 ක විදුලි විෂයයන් 53 ක ඌණතාවයක් පැවතුණි.

## 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:2:1 ප්‍රකාරව ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 3.5.2 සැපයීම් හා සේවා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ලංසු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් දින ගණනක් ලබාදීමකින් තොරව මෝටර් ග්‍රේඩරය සඳහා කැපුම් තල ජෝඩු 05 ක් මිලදී ගැනීමට මිල ගණන් කැඳවා රු.96,000 ක් වැයකර කැපුම් තල ජෝඩු 06 ක් මිළටගෙන තිබුණි.

(ආ) වාහනයක රු.61,130 ක් වූ අළුත්වැඩියාව සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:4:2 (අ) ප්‍රකාරව මිල ගණන් කැඳවීමෙන් තොරව පෞද්ගලිකව මිල ගණන් තුනක් 2017 ජුනි 20 දින ලබාගෙන තිබුණි. එහෙත් මිල ගණන් ලැබීමට පෙර 2017 ජුනි 19 දින තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශය ලබාදී තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------

### 4.1 අයවැය පාලනය

-----------------

සමාලෝචිත වර්ෂය සඳහා විෂයයන් 04 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන රුපියල් මිලියන 143 ක් වුවද, තත්‍ය වියදම රුපියල් මිලියන 45 ක් වූයෙන් අයවැයගත හා තත්‍ය සංඛ්‍යා අතර, ප්‍රමාණාත්මක විචලනය සියයට 35 සිට සියයට 72 දක්වා විය.

## 5. පද්ධති හා පාලන

-----------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ස්ථාවර වත්කම් අඩුවෙන් ගිණුම්ගත කිරීම. |
| | (ii) ලේඛන හා උපලේඛන අතර වෙනස්කම් |
| | (iii) ලේඛන පවත්වා නොගැනීම. |
| (ආ) ආදායම් පාලනය | - ලැබියයුතු ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) අයවැය පාලනය | - ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් අතර ප්‍රමාණාත්මක විචලනයන් පැවතීම. |
| (ඇ) ස්ථාවර වත්කම් පාලනය | - වත්කම් තක්සේරු කිරීම හා ලේඛන පවත්වා නොගැනීම. |